2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ සහ යාපනය විශ්වවිද්‍යාලයීය වවිනියා මණ්ඩපයේ තොරතුරු සන්නිවේදන හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාවට අපේක්ෂකයින් තෝරා ගැනීමේ පොදු යෝග්‍යතා පරීක්ෂණය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමට පොදු යෝග්‍යතා පරීක්ෂණයක් පැවැත්විය යුතු යැයි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත. ඒ අනුව එම පරීක්ෂණයට පෙනී සිට සමත් වන්නන් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයට හෝ යාපනය විශ්වවිද්‍යාලයේ වවිනියා මණ්ඩපයට තෝරා ගැනීම පිණිස සලකා බලනු ලැබේ. විශ්වවිද්‍යාලයීය ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශය - 2019/2020 අධ්‍යයන වර්ෂය අත්පොතෙහි 2.2.8.31 ඡේදයෙහි (115/116 පිටු) දක්වා ඇත.

ඉහත පාඨමාලාව සඳහා ඇතුළත්වීමට අපේක්ෂා කරන්නන් විසින් 2019/2020 අධ්‍යයන වර්ෂයට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයට අමතරව මෙහි දක්වා ඇති පොදු යෝග්‍යතා පරීක්ෂණයට ද අයදුම්කර පෙනී සිට ඉන් සමත් විය යුතුය.

මෙම යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පහත සඳහන් විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වෙන බව කරුණාවෙන් සලකන්න.

01	මිහින්තලය
02	වවිනියාව
03	යාපනය
04	කුරුණෑගල
05	මහනුවර
06	කොළඹ
07	බදුල්ල
08	මාතර
09	මඩකලපුව

යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම්

මෙම පාඨමාලාව සඳහා සලකා බැලීමට ඉහත සඳහන් පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කර ඇති 2019/2020 ප්‍රවේශ අත්පොතෙහි 2.2.8.31 ඡේදයේ (115/116 පිටු) දක්වා ඇති අමතර සුදුසුකම් අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පරිපාටිය

1. පහත දක්වා ඇති ආකෘතියට අනුව ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් තමා විසින් ම පිළියෙල කරගත් A 4 ප්‍රමාණයේ ඉල්ලුම් පත්‍රයක්

හෝ

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය http://www.rjt.ac.lk වෙබ් අඩවියෙන් හෝ යාපනය විශ්වවිද්‍යාලයීය වවිනියා මණ්ඩපයේ http://www.vau.jfn.ac.lk වෙබ්. අඩවියෙන් අවපතනය (Download) කර ගත් ආදර්ශ ඉල්ලුම් පත්‍රය

හෝ

මිහින්තලේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ විභාග හා අධ්‍යයන අංශය වෙතින් හෝ වවිනියාව, යාපනය විශ්වවිද්‍යාලයීය වවිනියා මණ්ඩපයෙහි විභාග ශිෂ්‍ය සේවා අංශය වෙතින් ලබාගත් අයදුම්පතක් භාවිත කරන මෙන් අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අත් අකුරින් සකස් කළ ඉල්ලුම්පත්‍ර භාර ගනු නොලැබේ.

2. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ අංක 008-1-001-8-1725841 දරන මහජන බැංකු ගිණුමට (අනුරාධපුර ශාඛාව) බැරවන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ලබාගත් ගෙවීම් වවුචරයක් මඟින් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තුව වූ රු. 1,000/- මුදල ගෙවිය හැක. තමා වෙත ජායා පිටපතක් තබාගෙන මුදල් ගෙවූ කුවිතාන්සියේ අයදුම්කරු සඳහා වූ පිටපත, ඉල්ලුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතු වේ. මුදල් ඇණවුම් හෝ චෙක්පත් භාරගනු නොලැබේ.

3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය සමඟ, 2019 අ.පො.ස. (උසස් පෙළ) සහතිකය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය සහ ජාතික හැඳුනුම්පත (හෝ තැපැල් හැඳුනුම්පත) යන වාර්තයේ සහතික කළ ජායා පිටපත් එවිය යුතු වේ. (එම සහතිකපත් විදුහල්පති හෝ කාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කර නිල මුද්‍රාව තැබිය යුතු වේ.) සහතික වල මුල් පිටපත් නො එවිය යුතු බව සලකන්න.

සැලකිය යුතුයි.

1. සහතික පත්‍රවල සඳහන් නම සහ ඉල්ලුම් පත්‍රයේ සඳහන් නමෙහි කිසියම් වෙනසක් ඇත්නම් එම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බව සහතික කරන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ.
2. යෝග්‍යතා පරීක්ෂණ සඳහා නියමිත අයදුම් කිරීමේ අවශ්‍යතාවන් සපුරාලන අපේක්ෂකයින් වෙත පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.
3. පහත දක්වා ඇති කරුණු වලට අදාළව ඔබගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැක.

අ. අපේක්ෂකයා විසින් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොතිබීම.

ආ. අයදුම් පත්‍රය සමඟ, බැංකුවට මුදල් ගෙවූ කුවිතාන්සිය සහ 2019 අ.පො.ස. (උසස් පෙළ) සහතිකය, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය සහ ජාතික හැඳුනුම්පත හෝ තැපැල් හැඳුනුම්පත යන වාර්තයේ නිසි පරිදි සහතික කළ ජායාස්ථ පිටපත් එවා නොතිබීම.

ඇ. අසම්පූර්ණ අයදුම්පත්‍ර

ඈ. අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට පෙර නොලැබීම.

ඉහත සඳහන් හේතූන් මත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප වන අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති පරීක්ෂණ ගාස්තු මොනයම් හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

අයදුම්පත්‍ර එවිය යුතු ආකාරය

අයදුම්පත්‍ර 2020 ජූනි මස 30 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ නියෝජ්‍ය ලේඛකාධිකාරි, විභාග සහ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

කරුණාකර ලියුම් කවරයේ වම් පස ඉහළ කොළුවරෙහි "ICT Aptitude Test 2019/2020" යනුවෙන් සඳහන් කරන්න.

යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වෙන දිනය

මෙම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය විභාග ප්‍රවේශ පත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ.

වැඩිදුර විමසීම් : **නියෝජ්‍ය ලේඛකාධිකාරි, විභාග හා අධ්‍යයන අංශය**
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ - දුරකතන අංක: 025-2266650
දිගුව: 2142, 2143

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,
විභාග හා ශිෂ්‍ය සේවා අංශය
වවිනියා මණ්ඩපය, පාරිස් පාර, වවිනියාව. - දුරකතන අංක : 024-2223317

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
මිහින්තලේ.
2020 ජූනි මස 02 වන දින.